# ලංසු කැඳවීමයි

## වාණිජ පුපුරණ ද්‍රව්‍ය ,ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය වැලිසර,රාගම වෙත විදුලි ඩෙටොනේටර් (මීටර් 4) ඒකක 1,000,000 ප්‍රසම්පාදනය කිරීම

**කොන්ත්‍රාත් කැඳවීමේ අංකය : MOD/SLN/04/2023**

1. වාණිජ පුපුරණ ද්‍රව්‍ය ,ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (CEFAP Unit) වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් පුපුරණ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා යෝග්‍ය, පිළිගත් හා සුදුසුකම් ලත් ලංසු කරුවන් වෙතින් පමණක් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| Contract No | Description | Qty |
|---|---|---|
| MOD/SLN/2023 | Electric Detonator (4Mtr) | 1,000,000 Nos |

2. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් විදේශීය නිෂ්පාදකයින් ඔවුන්ගේ දේශීය නියෝජිතයින් හරහාද සහ මෙරට ආනයන කරුවන් හටද ලංසු ඉදිරිපත් කල හැක.
3. ලංසු ලේඛණය සමග අදාල ආයතනයේ මූල්‍ය ප්‍රකාශන, පසුගිය වසර 03ක කාර්යය සාධන වාර්තා, ලංසු ලේඛණය මිලදී ගැනීම සඳහා ගෙවනු ලැබූ ලදුපත සහ ඇටෝර්නි බලය සඳහා පැවරුම් ලබන ලිපියද ඉදිරිපත් කල යුතුයි.
4. ලංසුවේ වලංගු කාලය, ලංසු විවෘත කල දිනයේ සිට දින 90ක් විය යුතුය.
5. ඉදිරිපත් කරන සියලුම ලංසු සඳහා රු. 3,720,000.00 (රුපියල් තිස්හත් ලක්ෂ විසිදාහක්) වටිනා ලංසු ඇපකරයක් ඉදිරිපත් කලයුතු අතර මෙම ලංසු ඇපකරයේ වලංගු කාලය ලංසු විවෘත කල දිනයේ සිට දින 120ක් හෝ ඊට වැඩි දිනක් විය යුතුය.

6. ලංසු කැඳවීම ජාත්‍යාන්තර තරගකාරී ලංසු තැබීමේ (ICB) ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර මෙම මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන අරමුදල් රජයේ අරමුදල් මගින් සපයනු ලබන ලැබේ. සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය ශ්‍රී ලංකා ප්‍රසම්පාදන මාර්ග උපදේශණය - 2006 සහ රජයේ මූල්‍ය රෙගුලාසි වලට යටත්ව සිදු කෙරේ.
7. ලංසු ඉදිරිපත් කරන සියලුම ලංසු කරුවන් ආරක්ෂක අමාත්‍යාංශයේ අසාදු ගත ලංසුකරුවන්ගේ ලේඛනයට ඇතුලත් නොවීම අනිවාර්ය වන අතර, ලංසු කැඳවීමේ ලේඛණයේ ඇතුලත් සියලුම අයිතමයන් සඳහා ලංසු ඉදිරිපත් කල යුතුවේ.

8. ලංසු ඉදිරිපත් කිරීම සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු අධ්‍යක්ෂ,වාණිජ පුපුරණ ද්‍රව්‍ය ,ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකයේ පහත දැක්වෙන දුරකථන අංක සහ ඊ-මේල් ලිපිනය මගින් විමසා ලබාගත හැක.

දුරකථන අංක : 011 295 8227
011295 5514
විද්‍යුත් තැපැල : director.cefap@gmail.com

9. තවද , සුදුසුකම් ලත් සහ උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට පහත දැක්වෙන ලිපිනයෙහි ස්ථාපිතව ඇති කාර්යාලය තුලදී ලංසු ලේඛනය නොමිලේ පරීක්ෂා කල හැක.

ප්‍රධාන මූල්‍ය නිලධාරි - 1
දෙවන මහල
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකිර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ
දුරකථන අංක : 011-1390719

ෆැක්ස් : 011- 2390720
විද්‍යුත් තැපැල : procurement@defence.lk

10. 2024 පෙබරවාරි මස 12 වන දින සිට 2024 මාර්තු මස 25 වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හීදී 0900 පැයේ සිට 1500 පැය දක්වා කාලය තුල ආපසු නොගෙවන රු.35,000.00 ක් මුදලින් ගෙවීමෙන් සහ ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසුව උනන්දුවක් දක්වන ලංසු ලංසුකරුවන් හට ඉංග්‍රිසි භාශාවෙන් සකස්කරන ලද ලංසු මිල කැදවුම් පත්‍රය (BIDDING DOCUMENT) පහත ලිපිනයෙහි ඇති කාර්යාලය මගින් මිලදී ගත හැක.තවද නිසිලෙස සකස් කරන ලද ලංසු මිල කැදවුම් පත ලංසු විවෘත කිරීමේ කටයුතු සදහා 2024 මාර්තු මස 26 වන දින 1100 පැයට හෝ ඊට පෙර දිනයකදී පහත දැක්වෙන කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. තවද 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත (Public Contract Act) යටතේ උපදෙස් ලබා දී ඇති පරිදි ලංසුකරුවන් විසින් ආයතනයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කලයුතු වේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරි - 1
දෙවන මහල
ආරක්ෂක අමාත්‍යාශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

11. ලංසු ඉදිරිපත් කරනු ලබන ලංසුකරුවන් ලංසු විවෘත කිරීමේ කටයුතු සදහා සහභාගි වීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සදහා සහභාගි වීමට පැමිණෙන පුද්ගලයින්ගේ නම්, ජාතික හැදුනුම්පත් අංක සහ අනෙකුත් විස්තරයන් ප්‍රධාන මූල්‍ය නිලධාරි - 1, දෙවන මහල, ආරක්ෂක අමාත්‍යාංශය යන ලිපිනය වෙත ලංසු විවෘත කිරීමේ දිනට දින 03කට පෙර ඉදිරිපත් කල යුතුය.

------------------------------
සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව